# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

## පරිපාලන කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම

## රත්මලාන පරිශ්‍රය සහ දක්ෂිණ මණ්ඩපය - සූරියවැව

- සහකාර ලේඛකාධිකාරී තනතුර

## දක්ෂිණ මණ්ඩපය - සූරියවැව

- සහකාර මූල්‍යාධිකාරී තනතුර

## ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි - කොන්ත්‍රාත් පදනම

## රත්මලාන පරිශ්‍රය

- කළමනාකරණ සහකාර III ශ්‍රේණිය තනතුර (එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම)

### වැටුප් පරිමාණ

01. සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී තනතුර :-
U-EX I (II) රු. 50,625 – 3x1,125 – 54,000 (EB) 55,335; 12x1,335 - 71,355 p.m. + (45% අනධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

02. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය තනතුර (එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම) :-
රු. 30,725 p.m. + (රු. 7,800 ජීවන වියදම් දීමනාව + රු. 5,000 මාසික දීමනාව)

### බඳවා ගැනීමේ ක්‍රමවේදය

අභියෝග්‍යතා පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

### වෙනත් ප්‍රතිලාභ

**ස්ථිර පදනම :**

සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනාව සඳහා හිමිකම, නොමිලේ ලබා දෙන සෞඛ්‍ය සහ ජීවිත රක්ෂණය, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද.

**කොන්ත්‍රාත් පදනම :**

සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම, වාර්ෂික දිරි දීමනා, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය.

### පොදු කොන්දේසි - සියලුම කාර්ය මණ්ඩලය සඳහා

01. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්කරුවන් තෝරාගැනීම, ඒ ඒ තනතුරෙහි / ශ්‍රේණියෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
03. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් (**www.kdu.ac.lk**) භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකවල සහතික කළ ඡායා පිටපත් සහිතව **2022 ඔක්තෝබර් 25** දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම කළ යුතුය.
04. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
05. අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
06. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතු ය.
07. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (**www.kdu.ac.lk**) භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව එවනු ලබන අයදුම්පත් සහ ඉහත අංක 06 හි ලබාදී ඇති උපදෙස් අනුගමනය කර නොමැති අයදුම්පත්‍ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.
08. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය.
09. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණය / ප්‍රායෝගික පරීක්ෂණය සහ / හෝ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.
10. අයදුම්කරුවන් තෝරාගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව සහ ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සහ/ හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.
11. අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණය/ ප්‍රායෝගික පරීක්ෂණය සහ/ හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
12. ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප් ගෙවනු ලබයි. වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.
13. කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා 2018.12.03 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපි අංක DMS/1823/Vol-III අනුව වැටුප් ගෙවනු ලබයි.

### පොදු කොන්දේසි - පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා

01. සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ 2017.06.28 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 15/2017 සහ අදාළ සංශෝධන වෙත යොමු වන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

### පොදු කොන්දේසි - ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි සඳහා

01. සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ 2018.07.16 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 06/2018 සහ අදාළ සංශෝධන වෙත යොමු වන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**

ලේඛකාධිකාරී,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,
රත්මලාන 10390,
ශ්‍රී ලංකාව.

අයදුම්පත් එවිය යුතු අවසන් දිනය
**2022 ඔක්තෝබර් 25**

වැඩි විස්තර සඳහා
පිවිසෙන්න
විද්‍යුත් තැපෑල
**www.kdu.ac.lk**

Source: Silumina (2022.09.25)